"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු"

178

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொது தொலைபேசி / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2021 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2021.09.30 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීම</u>

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/8/6/19 හා 2021.09.23 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01 | 2021.07.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2021 | සේවාමුක්ත හටයෙකු පත් කිරීමේ දී අදාල කර ගත යුතු වැටුප තීරණය කිරීම |
| 02 | 2021.06.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2021 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් වලදී ජයග්‍රහණය කර එම ආයතන වල නගරාධිපති/සභාපති/නියෝජ්‍ය නගරාධිපති/උප සභාපති/නාගරික මන්ත්‍රීවරුන්/ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ලෙස තේරී පත්වූ දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධරයන් වෙත ලබා දී ඇති රාජකාරි නිවාඩු සංශෝධනය |
| 03 | 2021.08.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(VII) | වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක:82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයින්, මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම |
| 04 | 2021.04.28 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 06/2021 | පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය නිර්ණය කිරීම |

177

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

o/c
04/30

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 26/2017(VII)

මගේ අංකය : Pns/P4/W&OP/F11
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2021.08.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක: 82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයින්, මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් පිළිබඳව ඔබගේ අවධානය යොමු කරවමි.

I. 2017.10.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017
II. 2018.03.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(I)
III. 2018.05.03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(II)
IV. 2018.08.02 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(III)
V. 2018.11.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(IV)
VI. 2021.02.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(V)
VII. 2021.08.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(VI)

ඉහත චක්‍රලේඛ වලින් 2021.08.05 දිනැතිව නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2017(VI) මෙයින් අවලංගු කරන අතර, ඒ වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

02. එම චක්‍රලේඛ මඟින් දැක්වූ පරිදි 82/83 හා M/F කාණ්ඩ යටතේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයේ ලියාපදිංචි වී ඇති රාජ්‍ය නිලධාරීන්ට මාර්ගගත ක්‍රමය යටතේ නැවත ලියාපදිංචි වීම සඳහා ලබා දී තිබූ අවසන් දිනය 2021.12.31 දක්වා නැවත දීර්ඝ කරමි.

03. මේ සම්බන්ධව 2021.12.31 දිනෙන් පසුව කරනු ලබන ඉල්ලීම් සහ පැරණි වැන්දඹු අනත්දරු අංක ප්‍රතික්ෂේප කරනු ලබන බැවින්, ඔබ යටතේ සිටින සියලුම නිලධාරීන් විධිමත් පරිදි දැනුම්වත් කර අදාළ දිනට නියමිත පරිදි ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතු බව වැඩිදුරටත් අවධාරණය කර සිටිමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය